මාගේ අංක:-13/05/03/0
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
කවුඩුලු වැව ව්‍යාපාරය
මැදිරිගිරිය
2019.02.2

කවුඩුලු වැව ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ කමිටුවේ
සියළුම සාමාජික මහත්ම/මහත්මීන් වෙත.

21 MAR 2019

## මාසික ව්‍යාපාර කළමනාකරණ කමිටුව 2019 පෙබරවාරි 21 - කවුඩුලු වැව ව්‍යාපාරය

1994 අංක 13 දරණ වාරිමාර්ග(සංසෝධන)පනතට අනුකූලව කවුඩුලු වැව මහා වාරිමාර්ග ව්‍යාපාරයේ මාසික ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම 2019.02.21 දින පෙ.ව.9.30 කවුඩුලු වැව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ රැස්වීම් ශාලාවේදී නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

### සහභාගී වූ රාජ්‍ය නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1. | ආර්.ඩී.කේ.රාජසූරිය | නේවාසික ව්‍යාපාර කළමනාකරු | ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය |
| 2. | පී.ජී.දඹෝරගම | වාරිමාර්ග ඉංජිනේරු | වාරිමාර්ග ප්‍රාදේශීය කාර්යාලය - කවුඩුල්ල |
| 3. | ඩබ්.කේ.එස්.එන් කුමාර | සංවර්ධන නිළධාරී | ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය |
| 4. | ඩබ්.ජී.එස්.එස්.ජෝතිරත්න | ඉංජිනේරු සහකාර | වාරිමාර්ග ප්‍රාදේශීය කාර්යාලය - කවුඩුල්ල |
| 5. | ඩී.කේ.එන්.ගුණවර්ධන | ඉංජිනේරු සහකාර | වාරිමාර්ග ප්‍රාදේශීය කාර්යාලය - කවුඩුල්ල |
| 6. | ඊ.ඩී.එම්.විමලධර්ම | තාක්ෂණ සහකාර | කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව |
| 7. | ඩී.එම්.ජේ.ඉන්දික දිසානායක | කෘ.ප.නි.ස. | ගොවිජනසේවා දෙපාර්තුමේන්තුව |
| 8. | එස්.වයි.ඩී.පාලිත සෙනරත් | කෘ.ප.නි.ස. | ගොවිජනසේවා දෙපාර්තුමේන්තුව |
| 9. | කේ.යූ.නදීකා දිල්රුක්ෂි. | කෘ.ප.නි.ස. | ගොවිජනසේවා දෙපාර්තුමේන්තුව |
| 10. | පී.සජිත් වසන්ත කුමාර | කෘ.ප.නි.ස. | ගොවිජනසේවා දෙපාර්තුමේන්තුව |

### සහභාගී වූ ගොවි සංවිධාන නියෝජිත මහතුන්

| අනු අංකය | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 01. | කේ.පී.අශෝක කරුණාසේන | ගරු සභාපති | 1බී යාය එක්සත් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 02. | එච්.එම්.ප්‍රදීප් කුමාර | ගරු ලේකම් | 1බී යාය එක්සත් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 03. | අනුර විජේතිලක | ගරු ලේකම් | සි.පී.පුර පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 04. | ආරියපාල | ගරු භාණ්ඩාගාරික | සි.පී.පුර පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 05. | ජී.ඒ.ෂෙල්ටන් පෙරේරා | ගරු සභාපති | කාලිංග බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 06. | ආනන්ද ශ්‍රී ධර්මසේන | ගරු සභාපති | රංකෙත බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 07. | අනුර ලංකේෂ්වර | ගරු ලේකම් | රංකෙත බෙදුම් ඇල ගොවි සංවිධානය |

| | | | |
|---|---|---|---|
| 13. | කේ.ජී.ප්‍රියංකර රත්නායක | ගරු ලේකම් | සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 14. | එම්.ජී.ඉංදික සමන් | ගරු උප සභාපති | මැණික්සොරෙ බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 15. | එම්.යූ.ජී.දසනායක | ගරු ලේකම් | මැණික්සොරොව්ව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 16. | එම්.කේ.විද්‍යාරත්න | ගරු සභාපති | සාම බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 17. | එච්.එම්.අතුල කුමාර | ගරු සභාපති | ගොවිසෙත බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 18. | සෝමරත්න | ගරු භාණ්ඩාගාරික | මහවැලි බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 19. | එච්.ඩබ්.පොඩි මහත්තයා | ගරු සභාපති | මහින්දපුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 20. | කේ.එම්.ඒ.ජී.සෙනවිරත්න | ගරු සභාපති | ප්‍රගති බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 21. | කේ.එම්.යූ.කරුණානායක | ගරු ලේකම් | ප්‍රගති බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 22. | යූ.ජී.එන්.යූ.කුමාර | ගරු සභාපති | පුබුදු බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 23. | එස්.විජේරත්න ගාල්ලගේ | ගරු සභාපති | සේසත බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 24. | ජී.එච්.මුණසිංහ | ගරු භාණ්ඩාගාරික | සේසත බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 25. | යූ.ජී.වසන්ත උදය කුමාර | ගරු සභාපති | ඩී.එස්.සේනානායක බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 26. | කේ.ජී.එස්.කළුආරච්චි | ගරු ලේකම් | ඩී.එස්.සේනානායක බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 27. | ඩී.එම්.කුයින්ටන් දිසානායක | ගරු සභාපති | ශ්‍රී විජය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 28. | එම්.එච්.ජී.ධම්මික අරුණ ශාන්ත | ගරු සභාපති | නාගරපුර සහන බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 29. | ආර්.එම්.රත්නායක | ගරු සභාපති | මහසෙන් බෙදුම් ඇළ ගොවි සංවිධානය |
| 30. | ටී.ජී.ප්‍රසන් ප්‍රදීප් | ගරු ලේකම් | මහසෙන් බෙදුම් ඇළ ගොවි සංවිධානය |
| 31. | ජගත් හෙළන් | ගරු සභාපති | එක්සත් බෙදුම් ඇළ ගොවි සංවිධානය |

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකරු ආර්.ඩී.කේ.රාජසූරිය මහතා විසින් පැමිණි රාජ්‍ය නිලධාරීන් හා ගොවි සංවිධාන නිලධාරීන් පිළිගන්නා ලදි

<u>අරමුණ පැහැදිලි කිරීම:- (නේවාසික ව්‍යාපාර කළමනාකරු)</u>

- මෙවර ව්‍යාපාර කමිටු රැස්වීම පැවැත්වීමට තිබූ දින ප්‍රාදේශීය කෘෂි කර්ම කමිටු රැස්වීම පැවැත්වූ බැවින් අද දිනට ව්‍යාපාර කමිටු රැස්වීම පැවැත්වීමට කටයුතු සංවිධානය කළා.
- 2019.02.02 දිනයෙන් ජල මුර නිකුත් කිරීම අවසන්.
- කන්න රැස්වීමේ තීරණ අනුව කටයුතු කර ඇත්නම් අමතර ජල මුර අවශ්‍ය නොවේවි.
- නියමිත කන්නටම මෙවර යල කන්න ආරම්භ කිරීමට හැකිවේවි.
- හොඳම ගොවි සංවිධානය තේරීමේ තරඟාවලිය පැවැත්වූවා.
- Peiseip ව්‍යාපෘතිය පිළිබඳව සාකච්ඡා කිරීම.
- රක්ෂිත වෙන් කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම.

## පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම.

| ගැටළුව | ලබාගත් විසඳුම | වගකීම |
|---|---|---|
| වාන් ඇළේ ගස් ඉවත් කිරීම | - පත්කර ඇති කමිටුව විසින් වාන් ඇළ පරික්ෂ කළා ඉදිරියේදී ගස් ඉවත් කිරීමට හැකිවේවි. (ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු) | - වාරිමාර්ග දෙපාර්තුමේන්තුව. |
| කෙත් ඇළවල ගවයන් බැදීම | - පසුගිය ව්‍යාපාර කමිටුවේදී ක්‍රමවේදයන් පිළිබඳව දැනුවත් කිරීම<br>- සිදු කළා.(නේවාසික ව්‍යාපාර කළමනාකරු)<br>- වැව් රක්ෂිතයට ගවයන් ඇතුල් කිරීම මේවන විටත් අඩුවී ඇත. (ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු)<br>- ගවයන් අයිති කරුවන් පිළිබඳව තොරතුරු ලබාදීමට කටයුතු කරන්න.<br>- අණ පනත් ප්‍රකාරව ඇළ වේල්ලේ ගවයන් බැදීම නීති විරෝධි කටයුත්තක් බව ගව හිමියන් දැනුවත් කිරීමට කටයුතු කළ හැකියි. (නේවාසික ව්‍යාපාර කළමනාකරු) | - වාරිමාර්ග දෙපාර්තුමේන්තුව.<br>- වාරිමාර්ග කළමනාකරණ අංශය<br>- ගොවි සංවිධාන |
| පිකප් ඇණිකට් එක අසල උද්‍යානයක් නිර්මාණය කිරීම | - ඇණිකට් එසේ සංවර්ධන වැඩ අවසන් කිරීමේ මේ පිළිබඳව සළකා බලනවා. (ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු) | - වාරිමාර්ග දෙපාර්තුමේන්තුව. |
| වාරිමාර්ග දෙපාර්තුමේන්තුවේ ස්කැවේටරය ලබාගැනීම. | - ස්කැවේටරය ගොවි සංවිධාන වෙත ලබා නොදීමට ලිඛිතව දැනුම් දී ඇත.<br>- ගොවි සංවිධානවල සංවර්ධන කටයුතු සඳහා ස්කැවේටරය ලබාදෙන්නයැයි ඉහළින් ලිඛිතව දැනුම් දෙන්නේ නම් ලබාදිය හැක.<br>- හානිවූ කොටස් නැවත සකස් කරන්නේ නම් ස්කැවේටරය ලබාදීමට හැකියාව ඇත. (ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු)<br>- ජනාධිපති තුමා හෝ මේ පිළිබඳව දැනුවත් කර යන්ත්‍රය ගොවි සංවිධානවලට ලබාගැනීමට කටයුතු කරමු(ගරු සභාපති - ඒකාබද්ධ ගොවි සංවිධානය) | - වාරිමාර්ග දෙපාර්තුමේන්තුව.<br>- ගොවි සංවිධාන |
| 3ඒ ඇලේ ප්‍රතිසංස්කරණ කටයුතු - මහින්දපුර බෙදුම් ඇළ ගොවි සංවිධානය | - මේවන විට සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත.(ගරු සභාපති - මහින්දපුර බෙදුම් ඇළ ගොවි සංවිධානය) | - වාරිමාර්ග දෙපාර්තුමේන්තුව. |
| සේවා පියස්වල 2% කොමිස් මුදල් ලබාගැනීම | - 2%ක කොමිස් මුදල් ලබාගැනීමට ඒකමතිකව තීරණය වී ඇත.<br>- මේ පිළිබඳව ප්‍රාදේශීය ව්‍යාපාර කමිටුවේදීද සාකච්ඡා කර ඇත. (නේවාසික ව්‍යාපාර කළමනාකරු) | - ගොවි සංවිධාන<br>- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මැදිරිගිරිය |

### ආයතන සංවර්ධන කටයුතු

- සෑම මසකම මාසික කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන්න.
- පවත්වූ කාරක සභා මහා සභා රැස්වීම්වල වාර්තා හැකි ඉක්මනින් කාර්යාලයට ලබාදීමට කටයුතු කරන්න.
- ගිණුම් පොත සැකසීමේ කටයුතු සඳහා දත්ත කළමනා කරුවන්ගේ සහයෝගය ලබාගන්න.
- ගිණුම් තොරතුරු නිවැරදි කර සෑම මසකම 25දිනට පෙර ලබාදීමට කටයුතු කරන්න.
- සෑම ගොවි සංවිධානයක ම ලියාදිංචි සහතිකයේ පිටපතක් කාර්යාලයට ලබාදෙන්න.
- ගොවි සංවිධානයේ සාමාජිකයින්ගේ නාම ලේඛනය ද ලබාදීමට කටයුතු කරන්න.

- බොහෝ ගොවි සංවිධානවල කාර්යාල පිළිවෙළට සකස් වී තිබීම පිළිබඳව සතුටු වෙනවා.

**වාරිමාර්ග දෙපාර්තුමේන්තුවේ අදහස් ඉදිරිපත් කිරීම:- *(වාරිමාර්ග ඉංජිනේරු - කවුඩුලු වැව)***

- අදවන විට කවුඩුලු වැවේ ජල මට්ටම අක්කර අඩි 88200යි.
- මේ දක්වා මින්නේරියෙන් ජලය ලබාගැනීම විටින් විට සිදු වුනා.
- කන්න රැස්වීම් තීරණ අනුව 2019.02.23 වන විට ජලය නිකුත් අර අවසන්.
- 2019 යල කන්න සඳහා ජලය ප්‍රමාණවත්.
- අස්වැන්න නෙලා අවසන් වුවහොත් මාර්තු මාසය අවසානයේ කන්න සඳහා ජලය නිකුත් කළ හැක.
- පසුගිය මාසයේ වාරිමාර්ග කාර්යාලයේ පැවැත්වූ ධර්ම දේශනය සඳහා දැක්වූ සහයට ස්තුතියි.
- සෑම ජලාශයක් ආසන්නයේම 2019.03.15 දින ආශිර්වාද පිරිත් දේශනයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.
- පිරිත් දේශනය සඳහා සෑම ගොවි සංවිධානයක ම සහයෝගය බලාපොරොත්තු වෙනවා.
  - මෙවැනි කටයුත්තක් බොහෝ කාලයකින් සිදුවී නොමැත.මෙවැනි පිංකම් පැවැත්වීමෙන් ගොවින් අතරද සබැදියාව ගොඩනැගේවි. (නේවාසික ව්‍යාපාර කළමනාකරු)

| ඉදිරිපත් කළ අය | ගැටලුව | විසඳුම | වගකීම |
|---|---|---|---|
| ගරු සභාපති - 1බි යාය එක්සත් බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • පිරිත් දේශනය පැවැත්වීමෙන් වර්ෂාව ඇති වුවහොත් එයින් ගොවීන්ට අගතියක් සිදුවේවි. | • මෙය ජාතික මට්ටමින් ගත් තීරණයක් බැවින් බිම් මට්ටමේ සිටින අපි මෙය වෙනස් කිරීම සුදුසු නොවේවි.(ගරු සභාපති - අරුනළු බෙදුම් ඇළ ගොවි සංවිධානය)<br>• මෙය වැසි පිරිතක් නොව ආශීර්වාදාත්මක පිරිත් දේශනයක්(නේවාසික ව්‍යාපාර කළමනාකරු)<br>• සියළු ගොවීන්ට පැහැදිළි කළයුතුයි මෙය වැසි පිරිතක් නොව ආශීර්වාදාත්මක පිරිත් දේශනයක් බව.(ගරු සභාපති - එක්සත් ගොවි බෙදුම් ඇළ ගොවි සංවිධානය) | • වාරිමාර්ග දෙපාර්තුමේන්තුව |
| ගරු සභාපති - සාම බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • අස්වැන් නෙළා අවසන් වීමෙන් පසුව පිරිත් දේශනය පැවැත්වීමට කටයුතු කරන්න. | | |
| ගරු සභාපති - 1බි යාය එක්සත් බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • කන්න රැස්වීම් තීරණ අනුව 2019.02.23 ජලය නිකුත් කර අවසන් උවත් තවත් ජල මුර දෙකක් 1බි යාය එක්සත් ගොවි සංවිධානයට අවශ්‍යයි.<br>• පසුගිය කන්නයේ ගොවි තැන් සම්පූර්ණයෙන් විනාශවීම නිසා ගොවිතැන් කටයුතු සඳහා මුදල් සොයාගැනීමට ගොවීන්ට නොහැකි වීම නිසා කන්න නියමිත වේලාවට ආරම්භ කිරීමට නොහැකි විය. | • ජලය මදිනම් ජලය ලබාදීම ගැටළුවක් නොමැත.<br>• අභාවතට කන්න ආරම්භයේදීම ජලය ලබාදීම සිදු කළත් සෑම කන්නක් අවසානයේදීම වැඩිපුර ජලමුරයක් හෝ මුර දෙක තුනක් ලබාදෙනවා.මෙය සෑම කන්නයකදීම ගැටළුවක්ව පවතිනවා.<br>• අමතර ජල මුර නිකුත් කිරීමෙන් මුල ගොවීන් ඉන් අපසුතාවයට පත්වෙනවා.(ගරු සභාපති - කාලිංග බෙදුම් ඇළ ගොවි සංවිධානය) | • වාරිමාර්ග දෙපාර්තුමේන්තුව |
| ගරු ලේකම් - විජිත බෙදුම් ඇළ ගොවි සංවිධානය | • විජය/විජිත/සමඟි ගොවි සංවිධාන සඳහාද තව එක් ජල මුරයක් අවශ්‍යයි. | | |

| | | | |
|---|---|---|---|
| ගරු සභාපති - නාගරපුර සහන බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • වර්ෂාව නිසා ලෙඩ රෝග ඇති වූ බැවින් තවමත් පීදෙන ගොයම් ඇත. ඒනිසා තවත් එක් ජල මුරයක් අවශ්‍යයි. | • අපිම එකතු වී ගන්නා තීරණ අපිම උල්ලංඝනය කිරීමෙන් අප කණගාටු විය යුතුයි.<br>• මහ කන්නයේ ලැබුනු වර්ෂාව ප්‍රයෝජනයට නොගැනීම නිසා මෙම තත්වය පැනනැගී ඇත.<br>• වැඩිපුර ජල මුර ඉල්ලා සිටීමෙන් නිසි වේලාවට යල කන්න ආරම්භ කිරීමට නොහැකිවේවි. (නේවාසික ව්‍යාපාර කළමනාකරු) | |
| ගරු සභාපති - 1බි යාය එක්සත් බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • ගවයින් කෙත් ඇළවල් විනාශ කරන්නේනම් ගවයින් සඳහා තණ පිටි ලබාදමට කටයුතු කරන්න | • ගවයින් කැවීම සඳහා ත් ඇළවල බැදීම සම්පූර්ණ තහනම්.මේ සඳහා වාරිමාර්ග දෙපාර්තුමේන්තුව නීතිමය ක්‍රියාමාර්ග ගතයුතුයි. (නේවාසික ව්‍යාපාර කළමනාකරු) | • වාරිමාර්ග දෙපාර්තුමේන්තුව |

ලබාදුම් ජලමුර ප්‍රමාණයට වඩා තවත් ජලමුර අවශ්‍යයි.

ජල මුරය

උස්මට්ටම 2019.02.27 සිට 02 දක්වා

පහත් මට්ටම 2019.02.01 සිට 04 දක්වා

යෝජනාව - ගරු සභාපති, සාම බෙදුම් ඇළ ගොවි සංවිධානය

ස්ථිර කිරීම - ගරු ලේකම්,මැණික්සොරොව්ව බෙදුම් ඇළ ගොවි සංවිධානය

## කෘෂි කර්ම දෙපාර්තුමේන්තුව - කෘෂි උපදේශක

- කන්න රැස්වීම් තීරණ අනුව කන්න ආරම්භ කළානම් තවත් දින 20ක් තුළ අස්වැන්න නෙළා අවසන් කළයුතුයි.
- ජලය බැඳ තැබීමෙන් ක්‍රිඩා හානිය වැඩිවේවි.
- කිරට නැමෙන කාලයේ ක්‍රිඩා හානිය බහුලයි.
- පුහුනු වැඩසටහන් සංවිධානය කරන්න.
- ජලය හිඟනම් පමණක් හරවන්න.
- 80%ක් කරළ පැසී ඇත්නම් අස්වැන්න නෙළන්න
- නිර්දේශ නොමැති වී වලට හානිය වැඩියි.
- කාබනික පොහොර යෙදූ ක්ෂේත්‍රවල හානිය අඩුයි.
- ගොවිපලතුළ නිසි ජලකළමනාකරණය කරගැනීමෙන් හානිය අවම කරගත හැක.

| ඉදිරිපත් කළ අය | ගැටලුව | විසඳුම | වගකීම |
|---|---|---|---|
| ගරු සභාපති - 1 බි යාය එක්සත් ගොවි බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • කැට යෙදීමෙන් පලිබෝධ හානි අවම කරගත හැකි බව කෘෂිකර්ම දෙපාර්තුමේන්තුවේ නිර්දේශය උවත් ඒවා යෙදීමෙන්ද කිසිවුදු ප්‍රතිපලයක් ලැබී නොමැත. | • පලිබෝධ නාශක හෝ වෙනත් තෙල් වර්ග ලබාගැනීමේදී නිවැරදි බිල්පතක් ලබාගැනීමට කටයුතු කරන්න. | • කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව |

| | | | |
|---|---|---|---|
| | • ගොවීන්ගේ අදහස කල් ඉකුත්වූ කැට නැවත පැකට් කර වෙළඳපලට ලබාදී ඇති බවයි. | • යොදන පලිබෝධ නාශකයේ හෝ තෙල් වර්ගවල සාම්පලයක් තබාගැනීමට කටයුතු කරන්න | |
| ගරු සභාපති - පුබුදු බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • CIC සමාගමේ ලොයන්ට් වල් නාශකය යෙදූ ක්ෂේත්‍රවල ගොයමේ යම් යම් වෙනසස් වීම් සිදුවූ බැවින් ගොවීන් අගතියට පත්වී ඇත. <br> • CIC සමාගම මෙම වල්නාශකයේ යම් වරදක් ඇති බව පිලිගෙන ඇත. <br> • අදාළ අගතියට පත් ගොවීන්ට වන්දියක් ලබා දෙනබව සඳහන් උවත් මෙතෙක් ඒ සඳහා පියවරක් ගෙන නොමැත. | • මේ පිළිබඳව ඉළ නිළධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරනවා. | • කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව |
| ගරු සභාපති - 1 බි යාය එක්සත් ගොවි බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • රජයේ පූර්ණ මැදිහත් වීමෙන් ගොවීන්ට අවශ්‍ය තෙල් හා පොහොර ලබාදීමට කටයුතු කරන්න. | • මේ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යංශයේ නිළධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරනවා. | • කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව |

## ගොවිජනසේවා දෙපාර්තුමේන්තුව - කෘ.ප.නි.ස

- වගා හානි සිදුවී ඇත්නම් දැන්ම දීමට කටයුතු කරන්න.
- ගොයම් කපන යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට අනුමැතිය ලැබී ඇත.

| ඉදිරිපත් කළ අය | ගැටලුව | විසඳුම | වගකීම |
|---|---|---|---|
| ගරු ලේකම් - ප්‍රගති බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • පසු ගිය කන්නයේ වන අලින් විසින් විනාශ කළ කුඹුරු සඳහා මෙතෙක් වන්දි ලබාදීමට කටයුතු කර නැත. | • අදාළ හානි පිළිබඳව කෘෂි රක්ෂණ මණ්ඩලයට තොරතුරු ලබාදී ඇත. | • ගොවිජනසේවා දෙපාර්තුමේන්තුව |
| ගරු සභාපති - 1 බි යාය එක්සත් ගොවි බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • වගා හානි සඳහා වන්දි ලබාදිමට මෙතෙක් රජය විසින් වැඩපිළවෙලක් යෙදා නොමැත. මුදල් ද වෙන්කර නොමැත. <br> • කෘෂි රක්ෂණ මණ්ඩලය මේ සඳහා වගකිව යුතුයි. <br> • අද ව්‍යාපාර කමිටු රැස්වීමට වගකිවයුතු සමහර ආයතන සහභාගී වී නොමැත | • ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේදී මේ පිළිබඳව සාකච්ඡා කළත් ප්‍රාදේශීය ලේකම් තුමිය මේ පිළිබඳව ඉහළ නිළධාරීන් දැනුවත් කර පිළිතුරක් ලබාගෙන නොමැති බව පැහැදිළි වෙනවා.(ගරු සභාපති - ඒකාබද්ධ ගොවි සංවිධානය) <br> • අදාල ආයතන දැනුවත් කළත් මේ සඳහා සහභාගී වී නොමැත.(නේවාසික ව්‍යාපාර කළමනාකරු) | • ගොවිජනසේවා දෙපාර්තුමේන්තුව <br> • කෘෂි රක්ෂණ මණ්ඩලය |

## PEISEIP ව්‍යාපෘතිය පිළිබඳව සාකච්ඡා කිරීම

- මූලික පදනම් දත්ත සමීක්ෂණය හා ඒකාබද්ධ ක්‍රියාකාරී සැළසුම් සකස් කර පොත් මුද්‍රණය කර ඇත.(නේවාසික ව්‍යාපාර කළමනාකරු)
- **PEISEIP** ව්‍යාපෘතිය යටතේ වැඩ ආරම්භ කරණ ලද සංවර්ධන වැඩසටහනේ වැඩකටයුතු අවසන් කර ඇත.(ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු)

<u>හොඳම ගොවි සංවිධානය තේරීමේ තරඟාවලිය පිළිබඳව දැනුවත් කිරීම.</u>

- ගොවි සංවිධාන 25න් ගොවි සංවිධාන 22ක තරඟය පවත්වා අවසන් කර ඇත.
- සාම/සි.පි.පුර පැරකුම්/රංකෙත ගොවි සංවිධාන වල යම් යම් අඩුපාඩුකම් නිසා තරඟය පැවැත්වීමට නොහැ... ය.
- 2019.03.07 දින තරඟය පවත්වා තරඟ කටයුතු අවසන් කරනවා.(සංවර්ධන නිළධාරී)
- මෙම තරඟයෙන් බලාපොරොත්තු වන්නේ සංවිධාන අදවන විට සිටින ස්ථාන හා ගොවි සංවිධානවල පවතින අඩුපාඩු පිළිබඳව අවබෝධයක් ලබාගැනීමයි.(නේවාසික ව්‍යාපාර කළමනාකරු)

| ඉදිරිපත් කළ අය | ගැටලුව | විසඳුම | වගකීම |
|---|---|---|---|
| ගරු ලේකම් - ප්‍රගති බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • තරඟයෙන් ඉවත් වූ රංකෙත හා සි.පි.පුර ගොවි සංවිධාන තරඟාවලියෙන් ඉවත් කළයුතුයි. | • ඉදිරියේදී තරඟය පැවැත්වීමට කටයුතු කරනවා. | • නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය |
| ගරු ලේකම් - රංකෙත බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • අප තරඟයෙන් ඉවත් කර හෝ අදාල පරීක්ෂණය සිදු කර ගොවි සංවිධානයේ අඩුපාඩු පෙන්වාදීමට කටයුතු කරන්න. | | |
| ගරු සභාපති - පුබුදු බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • තරඟාවලිය පිළිබඳව දැනුවත් කිරීම් සති 02කට කළින් සිදුකළත් තරඟය නොපැවැත්වූ ගොවි සංවිධාන මේ සඳහා වැඩි උනන්දුවක් දක්වා නොමැත.<br>• තරඟයෙන් ජයගැනීම කෙසේවෙතත් ගොවි සංවිධානවල අති අඩුපාඩු ඇති තැන් හඳුනාගැනීමට හැකි වීමම ලොකු ජයග්‍රහනයක්.<br>• පොත්පත් හා ලිපිලේඛන සකස් කර නිවැරදි කරගැනීමට හැකි වූවා. | | |
| ගරු සභාපති - ඒකාබද්ධ ගොවි සංවිධානය. | • රංකෙත ගොවි සංවිධානයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් නොයෙක් පැමිණිලි ලැබී ඇත. ඒ පිළිබඳව සැළකිල්ලෙන් කටයුතු කරන්න. | • නිළවරණය පැවැත්වීම් කටයුතුද අවස්ථා දෙකකදි ම කල්දැමීමට සිදු වූවා . කෙසේ හෝ නිලවරණය පැවැත් වූවත් මෙතෙක් ගොවි සංවිධානයේ ක්‍රියා කාරීත්වය පිළිබඳව සෑහීමකට පත්විය නොහැක.(නේවාසික ව්‍යාපාර කළමනාකරු) | • නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය<br>• රංකෙත බෙදුම් ඇළ ගොවි සංවිධානය |

<u>වෙනත් ගැටළු ඉදිරිපත් කිරීම</u>

**01.**

– අප ගොවි සංවිධානයේ ප්‍රධාන නිළධාරීන් දෙදෙනාම දේශපාලන කටයුතු වල නියැලී සිටින බැවින් ගොවි සංවිධානයේ කටයුතු සඳහා වැඩි අවධානයක් යොමු කිරීමට නොහැක් විය.

– ගොවි සංවිධානයේ අත ඉතිරිය 600000.00ක් ලෙස සටහන් උවත් එපමණ මුදලක් අත ඉතිරියේ නොමැත. වියදම් දැරූ යම් යම් වියදම් සඳහා වව්චර් නොදැම්ම නිසා මෙම අත ඉතිරිය පෙන්වනවා. *(ගරු ලේකම් - රංකෙත බෙදුම් ඇළ ගොවි සංවිධානය.)*

**02.**

– අදවන විට වී මිල 1850.00යි . මෙම මිළ කෙසේවත් ප්‍රමාණවත් නැහැ. ජනාධිපති තුමා මැදිහත් වී හෝ වී මිළ වැඩිකර දියයුතුයි. *( ගරු සභාපති - 1 බී යාය එක්සත ගොවි බෙදුම් ඇළ ගොවි සංවිධානය.)*

**03.**

– අරුනළු බෙදුම් ඇළ ගොවි සංවිධානයේ රක්ෂිත වෙන් කිරීම හා රක්ෂිත කණු දැම්ම උත්සවාකාරයෙන් 2019.02.28 දින බෙදුම් ඇළ ගොවි සංවිධානයේ ක්ෂේත්‍රයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මේ සඳහා සෑම ගොවි සංවිධානයකම සහභාගීත්වය අපේක්ෂා කරණවා. *(ගරු සභාපති - අරුනළු බෙදුම් ඇළ ගොවි සංවිධානය)*

<u>ස්තුති කථාව - ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති තුමා.</u>

- මෙවර ව්‍යාපාර කමිටු රැස්වීම සාර්ථක කරගැනීමට පැමිණි සියළුම රාජ්‍ය නිළධාරීන්ට ගොවි සංවිධාන නිළධාරීන්ට ස්තුති කරමින් කමිටු රැස්වීම අවසන් කරන ලදි.

.................................

ආර්.ඩී.කේ රාජපුරිය,
නේවාසික ව්‍යාපාර කළමනාකරු,
කවුඩුලුවැව ව්‍යාපාරය,
මැදිරිගිරිය.

ආර්.ඩී.කේ. රාජපුරිය
නේවාසික ව්‍යාපාර කළමනාකරු
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
කවුඩුලුවැව ව්‍යාපාරය
මැදිරිගිරිය.

පිටපත් -

1. දිස්ත්‍රික් ලේකම් - පොළොන්නරුව. - කා.දැ.ස
2. අධ්‍යක්ෂ,වාරිමාරිග කළමනාකරණ අංශය. - කා.දැ.ස
3. ප්‍රාදේශිය ලේකම්,මැදිරිගිරිය. - කා.දැ.ස
4. කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ,පොළොන්නරුව. - කා.දැ.ස
5. ගොවිජනසේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ,පොළොන්නරුව. - කා.දැ.ස
6. කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ,පොළොන්නරුව. - කා.දැ.ස
7. අන්තර් පළාත් කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ. - කා.දැ.ස